Article 13 (1)
Article 12 (1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020-12-14

පැමිණිලිකරු : එච්.එම්.ජේ.එස්. කරුණාරත්න මහතා,
අංක : 76, මහවැලිතැන්න,
මිගලෑව.

වගඋත්තරකරුවන් : 01. ස.පො.අ. යසන්ත ගමගේ මහතා,
පොලිස් අධිකාරී කාර්යාලය,
කළුතර.

02. පො.ප.චමින්ද මහතා,
ස්ථානාධිපති, පොලිස් ස්ථානය,
කළුතර - උතුර.

03. උ.පො.ප. ගුණසේකර මහතා,
පොලිස් ස්ථානය,
කළුතර - උතුර.

04. පො.කො. 27576 විතානාරච්චි මහතා,
පොලිස් ස්ථානය,
කළුතර - උතුර.

<u>පැමිණිලි අංකය : HRC/BD/52/15</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2015.02.06 දින පැය 17.30 ට පමණ කළුතර උතුර පොලිස් වසමේ සිදුවූ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

රිය අනතුරකට අදාලව නාඳුනන පුද්ගලයෙක් විසින් ලබා දී ඇති පැමිණිල්ලකට අදාලව තම යතුරු පැදියේ අංකය අදාල කරමින් කිසිදු විමර්ශනයක් සිදු නොකර තමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීම තුළින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවයි. එසේම අදාල රිය අනතුර සිදු වූ දින එනම්, 2015.02.06 දින තමා පැය 07.20 සිට පැය 17.15 දක්වා බදුල්ල පිහිටි ඌව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කල බවට ලිඛිතව කරුණු ඉදිරිපත් කල නමුත් ඒ සම්බන්ධයෙන්ද කිසිදු විමර්ශනයක් නොකර මෙම අත්අඩංගුවට ගැනීම සිදුකල බවද සඳහන් කර ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

- පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම -

පැමිණිල්ලට අදාලව කරුණු ඉදිරිපත් කරමින් පළවන වගඋත්තරකාර සහකාර පොලිස් අධිකාරි යසන්ත ගමගේ යන සඳහන් කර ඇත්තේ, 2015.02.06 වන දින කළුතර - උතුර පොලිස් වසමේ රිය අනතුරක් පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එහි මුල් පැමිණිල්ලට අනුව රිය අනතුර සිදුකරන ලද්දේ WP BBC 8510 දරණ යතුරු පැදියෙන් බව සඳහන් වී ඇති බවත්, මේ සම්බන්ධයෙන් මෝටර් රථ කොමසාරිස්වරයාට දැනුම්දීමෙන් අනතුරුව එම යතුරු පැදියේ වර්තමාන අයිතිකරු පිළිබඳ තොරතුරු ලබාගත් බවත්, එහි අයිතිකරු ලෙස එච්.එම්. අසංක සදුන් කරුණාරත්න එනම්, මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිකරු බවට වාර්තා වී ඇති බවත් සඳහන් කර ඇත. ඒ අනුව එම පුද්ගලයාට කළුතර උතුර පොලිසිය මගින් 2015.02.07 වන දින යතුරු පැදිය සහ බලපත්‍රය රැගෙන පෙනීසිටින ලෙස දුරකථන පණිවිඩයක් මගින් දන්වා ඇති බවත්, පසුව ඔහු විසින් හාලිඇල පොලිසිය මගින් පණිවිඩයක් යොමු කරමින් ඔහු එදින එම වේලාවේදී බදුල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කාර්යාලයේ සේවය කල බවට දන්වා ඇති බවත්, නමුත්, මේ සම්බන්ධයෙන් තොරතුරු පරීක්ෂා කිරීම සඳහා යතුරු පැදිය ඉදිරිපත් කල යුතු බැවින් යතුරු පැදිය සමග පැමිණෙන ලෙසට ඔහුට නැවතත් දැනුම්දුන් බවත් සඳහන් කර ඇත.

මේ වනවිට මෙම රිය අනතුර සිදුකරන ලද්දේ පොලිස් නිලධාරියෙක් බවට ප්‍රසිද්ධ වූ නිසා එය පොලිසියට ගැටළුවක් වී තිබූ බවට සඳහන් කර ඇති අතර මෙම රිය අනතුරෙන් තුවාල සිදුවී රෝහල් ගත කර සිටි තුවාලකරු 2015.02.15 වන දින මියගිය බැවින් ඒ සඳහා සටහන් යොදා රිය අනතුර කර පලා යන අයවළුන් කඩිනමින් සාක්ෂි වසන් කිරීම සඳහා එය අළුත්වැඩියා කිරීමට කාලය ඇති බැවින් හා රිය අනතුර සම්බන්ධයෙන් පළමු තොරතුරට අමතරව කිසිදු තොරතුරක් ලැබී නැති බැවින් ද, මෙම අනතුර WP BBC 8510 දරණ යතුරු පැදියෙන් සිදුකර

ඇත්ද නැත්ද යන්න පරීක්ෂා කිරීම සඳහා යතුරු පැදිය රස පරීක්ෂක හා සොකෝ නිලධාරීන් ලවා පරීක්ෂා කිරීම සඳහා තමා විසින් නියෝග ලබාදුන් බවත් සඳහන් කර ඇත.

මෙවැනි රිය අනතුරක් සිදුවූ පසු ඒ සඳහා චෝදනා ලබන අය අදාළ බලපත්‍ර සහ යතුරු පැදිය පරීක්ෂා කළ යුතු බවට මෙම පැමිණිලිකරු හොඳින්ම දැනුවත් අයකු වන නමුත් ඔහු එසේ නොකළ බවත්, එම නිසා යතුරු පැදිය සමග පැමිණෙන ලෙසට ඔහුට දැනුම්දුන් අතර, ඒ අනුව ඔහු පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් අනතුරුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කර ඇත.

මෙම පැමිණිලිකරුට යතුරු පැදිය ඉදිරිපත් කරන ලෙසට දැනුම් දුන්නද ඔහු 2015.02.13 වන දින දක්වා යතුරු පැදිය නොපෙන්වීම තුලින් ඔහු සම්බන්ධයෙන් සැකයක් මතු වූ බැවින් ඒ අනුව මෙම අත්අඩංගුවට ගැනීම සිදුකළ බවද වැඩිදුරත් සඳහන් කර ඇත.

- දෙවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.ප. චමින්ද යන අයගේ ප්‍රකාශය =:

දෙවන වගඋත්තරකරු ලෙස නම් කර ඇති පො.ප. චමින්ද මහතා ප්‍රකාශ කර ඇත්තේ, අදාළ රිය අනතුර සම්බන්ධයෙන් මුල් තොරතුරේ සඳහන් යතුරු පැදියේ අයිතිකරු වන පැමිණිලිකරු පොලිස් ස්ථානයට පැමිණීමෙන් පසුව ඔහුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට උපදෙස් දුන් බවයි. මෙදින තමා වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ බවත්, අනතුර සම්බන්ධයෙන් සියළුම විමර්ශන රථ වාහන අංශයෙන් සිදුකළ බවත්, මෙම පැමිණිලිකරුට දින ගණනාවක් පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට දැනුම්දී තිබුණ ද එම දැනුම්දීම අනුව පොලිස් ස්ථානයට නොපැමිණීම මත රථ වාහන අංශය විසින් අදාළ විමර්ශනය සිදුකර අත්අඩංගුවට ගැනීම සඳහා නියෝග තිබූ බැවින් අදාළ නියෝග වල අනුව කටයුතු කරන ලෙසට පහළ නිලධාරීන්ට උපදෙස් දුන් බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

- තුන්වන වගඋත්තරකරු වන උ.පො.ප.ගුණසේකර යන අයගේ ප්‍රකාශය =:

තුන්වන වගඋත්තරකරු වන උ.පො.ප.ගුණසේකර යන අය ප්‍රකාශ කර ඇත්තේ, තමා 2015.02.18 වන දින රථ වාහන අංශයේ වැඩ බලන ස්ථානාධිපති ලෙස කටයුතු කළ බවත්, අදාළ යතුරු පැදි අනතුර සම්බන්ධයෙන් වාර්තා වී තිබූ අතර, එම අනතුරට අදාළව මුල් තොරතුරේ සඳහන් යතුරු පැදියේ අයිතිකරුට පොලිසියට පැමිණෙන ලෙසට කිහිපවතාවක් දැනුම්දී තිබූ බවත්, එම අය පොලිසියට පැමිණ ප්‍රකාශයක් ලබාදී තිබුණද යතුරු පැදිය ස්ථානය වෙත

ඉදිරිපත් කර නොතිබූ අතර, පසුව එම අයව පොලිස් ස්ථානයට කැඳවීමෙන් අනතුරුව ඔහුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවද සඳහන් කර ඇත.

- හතරවන වගඋත්තරකරු වන පො.කො. 27576 විතානාරච්චි මහතාගේ කරුණු දැක්වීම -:

හතරවන වගඋත්තරකරු වන පො.කො. 27576 විතානාරච්චි මහතා ප්‍රකාශ කර ඇත්තේ, 2015.02.18 වන දින තමා පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ සේවය කරමින් සිටි බවත්, එසේ සිටියදී මෙම පැමිණිලිකරුට අදාල වන රිය අනතුර සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් නොකළ බවත්, රථ වාහන අංශයේ ස්ථානාධිපතිව සිටි උ.පො.ප. ගුණසේකර මහතා සහ වැඩ බලන ස්ථානාධිපති පො.ප. චමින්ද මහතාගේ උපදෙස් මත මෙම පැමිණිලිකරුව පොලිස් ස්ථානයට කැඳවා ප්‍රකාශයක් සටහන් කොට බී වාර්තාවක් මගින් අධිකරණයට කරුණු වාර්තා කිරීමට කටයුත කළ බවත්ය. තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ උසස් නිලධාරින්ගේ නියෝග හා උපදෙස් මත තමා රාජකාරි සිදුකළ බවයි.

**නිරීක්ෂණ :-**

2015.02.06 වන දින යතුරු පැදියකින් රිය අනතුරක් සිදුකොට යතුරු පැදිකරු පලාගොස් ඇති බවටත් එය යතුරු පැදිය WBDC 8510 දරණ යතුරු පැදිය වන බවටත් පොලිස් ස්ථානය වෙත මුල් තොරතුරක් ලැබී ඇත. ඊට අදාලව 2015.02.18 දින පැමිණිලිකරුව පොලිසියට කැඳවා ඇති අතර, පැමිණිලිකරු පොලිසියට පැමිණ ප්‍රකාශයක් ලබාදී ඇත. එම ප්‍රකාශය ලබාදීමේදී අදාල දින එනම්, 2015.02.06 පැය 07.20 සිට පැය 17.15 දක්වා කාලය තුළ ඔහු සේවය කරන ඌව පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ රාජකාරි කළ බවට හා ඒ සඳහා සාක්ෂි, විමර්ශනයේදී ලිඛිතව පැමිණිලිකරු විසින් ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. නමුත් ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් පුළුල් විමර්ශනයක් නොකර පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු පසුව මේ සම්බන්ධයෙන් උසස් නිලධාරින්ට දැන්වීමෙන් අනතුරුව 2016.02.06 වන දින යතුරු පැදි අනතුර සම්බන්ධයෙන් නියම සැකකරුව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර, පැමිණිලිකරුව නිදහස් කර ඇති බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති සාක්ෂියට අනුව වගඋත්තරකරුවන් අදාල කාර්යාලයේ CCTV කැමරා පද්ධතිය පරීක්ෂාවක් නොකළ බවද ඉදිරිපත්වී ඇති තොරතුරු මත නිරීක්ෂණය වේ.

තවද, හතරවන වගඋත්තරකරු ඉහළ නිලධාරින්ගේ නියෝග මත පැමිණිලිකරුගෙන් ප්‍රකාශයන් ලබාගෙන අත්අඩංගුවට ගැනීම සටහන් කර ගැනීම පමණක් සිදුකර ඇති බැවින් මෙම වගඋත්තරකරුට මෙම පැමිණිල්ලේ වගකීම පැවරීම සුදුසු නොවන බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයයි.

**නිගමනය :-**

පැමිණිලිකරු අදාල රිය අනතුර සිදුවූ දින වන 2015.02.06 වන දින තමා රාජකාරි කරන ස්ථානයේ සේවය කල බවට තහවුරු කල හැකි සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම සාක්ෂිය සාක්ෂි ආඥා පනතේ 11 වන වගන්තියට අනුව (Alliba) වර්ගයේ ප්‍රභල සාක්ෂියක් වන අතර, එම සාක්ෂිය විමර්ශන අවස්ථා වලදී ඉදිරිපත් කිරීමට නීතියෙන් චූදිතයෙකුට අවස්ථාව ලබාදී ඇති ඇත. ඒ අනුව පැමිණිලිකරු කටයුතු කර ඇති බවද මෙහිදී අනාවරණය වී ඇත. එසේම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32(1) වගන්තිය ප්‍රකාරව සාධාරණ සැකයක් පැමිණිල්ලක්, ඔත්තුවක් මත අත්අඩංගුවට ගැනීමට ප්‍රතිපාදන සලසා ඇති අතර, මෙම අත්අඩංගුවට ගැනීම සාධාරණය හෙතුවකට සිදුකල බව නිගමනය කල නොහැක. එහිදී කිසිදු විමර්ශනයක් සිදුකර නොමැත. තවද <u>රොද්‍රිගෝ එ. උ.පො.ප ඉමල්ක පොලිස් ස්ථානය, කිරුළපන නඩුවේදී</u> මෙම "සාධාරණ" කරුණු මත අත්අඩංගුවට ගැනීම පිළිබඳව දක්වා ඇත.

එසේ පැමිණිලිකරු අත්අඩංගුවට ගැනීම තුලින් 1978 ශ්‍රී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(1) ව්‍යවස්ථාව මගින් සහ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. ඒ අනුව, 01 සිට 03 දක්වා වන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට රු. 50,000/- ක (රුපියල් පනස් දහසක) වන්දි මුදලක් ලබාදිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. වගඋත්තර පාර්ශවයේ ඉහත ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පතිවරයා, නීතිපතිවරයා, සහ පොලිස් කොමිෂන් සභාව වෙතද යොමුකරනු ලැබේ.

2024.01.15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ගරු අමාත්‍යතුමා,
   14 මහල, සුහුරුපාය,
   සුභූතිපුර පාර, බත්තරමුල්ල.

2. නීතිපතිතුමා,
   නීතිපති දෙපාර්තමේන්තුව,
   කොළඹ.

3. පොලිස්පතිතුමා,
   පොලිස් මූලස්ථානය,
   කොළඹ 01.

4. සභාපති,
   ජාතික පොලිස් කොමිෂන් සභාව,
   බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
   කොළඹ 07.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපත් කොමිෂන් සභාවට ලැබීමට සැලස්විය යුතුය.

B/R